# පාලනය

ශ්‍රී ලංකා මහ බැංකුවේ මෙහෙයුම් කටයුතු ඵලදායී ව අධීක්ෂණය, වගවීම සහ නිසි කළමනාකරණය සහතික කිරීම සඳහා නිර්මාණය කර ඇති මහ බැංකුවේ පාලන ව්‍යුහය ප්‍රධාන මණ්ඩල දෙකකින් සමන්විත වේ. ඒවා නම් පාලක මණ්ඩලය සහ මුදල් ප්‍රතිපත්ති මණ්ඩලයයි. මෙම මණ්ඩල දෙක ස්ථාපිත කර ඇත්තේ වෙනස් ව්‍යවස්ථාපිත වගකීම් ඉටු කිරීම සඳහා ය.

## පාලක මණ්ඩලය

මුදල් ප්‍රතිපත්තිය හැර මහ බැංකුවෙහි කටයුතු පරිපාලනය සහ කළමනාකරණය අධීක්ෂණය කිරීම සම්බන්ධ ව පාලක මණ්ඩලය වගකිව යුතු ය. මහ බැංකු අධිපතිවරයා පාලක මණ්ඩලයේ සභාපතිවරයා වන අතර ආර්ථික විද්‍යාව, බැංකුකරණය, මූල්‍ය, ගිණුම්කරණය සහ විගණනය, නීතිය හෝ අවදානම් කළමනාකරණය යන අංශවල විශේෂඥතාවක් සහිත තවත් සාමාජිකයින් හය දෙනෙකුගෙන් පාලක මණ්ඩලය සමන්විත වේ.

බැංකුවේ පොදු ප්‍රතිපත්ති හා සම්බන්ධ තීරණ ගැනීම, ආයතනික උපායමාර්ගය සකස් කිරීම, අයවැය සහ මූල්‍ය ප්‍රකාශ අනුමත කිරීම සහ අභ්‍යන්තර පාලනයන් සහ අවදානම් කළමනාකරණ කටයුතු අධීක්ෂණය කිරීම පාලක මණ්ඩලය විසින් සිදු කරනු ලැබේ.

## මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය

මෙම මණ්ඩලයට පැවරී ඇත්තේ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්තිය සම්පාදනය කිරීම සහ දේශීය මිල ස්ථායීතාව අත්කර ගැනීම සහ පවත්වාගෙන යාම සඳහා නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුව සමඟ සමපාත වන නම්‍යශීලී විනිමය අනුපාත ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමයි. එහි සභාපතිවරයා ලෙස මහ බැංකු අධිපති කටයුතු කරන අතර පාලක මණ්ඩලයේ සාමාජිකයින් සහ ආර්ථික විද්‍යාව හෝ මූල්‍ය ක්ෂේත්‍රය පිළිබඳ විශේෂඥයින් දෙදෙනෙක් ද මිල ස්ථායීතාව සහ මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව සඳහා වගකිව යුතු නියෝජ්‍ය අධිපතිවරු දෙදෙනා ද මෙහි සාමාජිකයින් ලෙස කටයුතු කරති.

මෙම ව්‍යුහය හරහා ශ්‍රී ලංකා මහ බැංකුව විනිවිදභාවය, වගවීම සහ අඛණ්ඩත්වය සහතික කරයි.

## පාලක සහ මුදල් ප්‍රතිපත්ති මණ්ඩල සාමාජිකයින් පත් කිරීම හා ධූර කාලය

මුදල් අමාත්‍යවරයාගේ නිර්දේශය මත සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41 අ වගන්තිය අනුව ස්ථාපිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමැතිය ඇති ව ජනාධිපතිවරයා විසින් මහ බැංකු අධිපතිවරයා, පාලක මණ්ඩල සාමාජිකයින් සහ මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය සඳහා විශේෂඥ සාමාජිකයින් පත් කරනු ලැබේ. අධිපතිවරයා හැර අනෙකුත් පත් කරන ලද සාමාජිකයෝ විධායක නොවන නිලධාරීන් ලෙස සේවය කරති.

අධිපතිවරයාගේ සහ පත් කරන ලද සාමාජිකයින්ගේ ධූර කාලය වසර හයක් වන අතර තවත් එක් ධූර කාලයක් සඳහා නැවත පත් කිරීමට ද හැකිය. එසේ වුව ද සමස්ත ධූර කාලය වසර දොළහක් නොඉක්මවිය යුතුය.

## පාලක මණ්ඩල සංයුතිය

- ආචාර්ය නන්දලාල් වීරසිංහ - අධිපති (සභාපති)
- නිහාල් ෆෝන්සේකා මහතා - පත් කළ සාමාජික
- ආචාර්ය රවීන්ද්‍ර රත්නායක - පත් කළ සාමාජික
- අනුෂ්ක විජේසිංහ මහතා - පත් කළ සාමාජික
- විශ්වනාදමූර්ති ගෝවින්දසාමි මහතා - පත් කළ සාමාජික
- මනිල් ජයසිංහ මහතා - පත් කළ සාමාජික
- මෛත්‍රී වික්‍රමසිංහ මහතා - පත් කළ සාමාජික
  - *පාලක මණ්ඩලයෙහි ලේකම් - දීමුතු සමරතුංග මිය, සහකාර අධිපති*

## මුදල් ප්‍රතිපත්ති මණ්ඩල සංයුතිය

- ආචාර්ය නන්දලාල් වීරසිංහ - අධිපති (සභාපති)
- නිහාල් ෆොන්සේකා මහතා - පත් කළ සාමාජික
- ආචාර්ය රවීන්ද්‍ර රත්නායක - පත් කළ සාමාජික
- අනුෂ්ක විජේසිංහ මහතා - පත් කළ සාමාජික
- විශ්වනාදමූර්ති ගෝවින්දසාමි මහතා - පත් කළ සාමාජික
- මනිල් ජයසිංහ මහතා - පත් කළ සාමාජික
- මෛත්‍රී වික්‍රමසිංහ මහතා - පත් කළ සාමාජික
- ආචාර්ය දුෂ්නි වීරකෝන් - පත් කළ සාමාජික (විශේෂඥ)
- මහාචාර්ය ප්‍රියංග දුනුසිංහ - පත් කළ සාමාජික (විශේෂඥ)
- ආචාර්ය චන්ද්‍රනාත් අමරසේකර - මිල ස්ථායීතාව භාර නියෝජ්‍ය අධිපති/සාමාජික
- සිරිකුමාර කුඩාගම මහතා - මූල්‍ය පද්ධති ස්ථායීතාව භාර නියෝජ්‍ය අධිපති/සාමාජික
  - *මුදල් ප්‍රතිපත්ති මණ්ඩලයෙහි ලේකම් - දීමුතු සමරතුංග මිය, සහකාර අධිපති*


## පාලක සහ මුදල් ප්‍රතිපත්ති මණ්ඩල රැස්වීම්

පාලක මණ්ඩලය අවම වශයෙන් මසකට වරක්වත් රැස්වන අතර මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය අවම වශයෙන් සෑම මාස දෙකකට වරක්වත් රැස් වේ. සභාපතිවරයාට රැස්වීම් කැඳවීමේ බලය ඇති අතර ඊට අමතරව ඕනෑම සාමාජිකයින් දෙදෙනෙකුගේ ලිඛිත ඉල්ලීමක් මත ද රැස්වීමක් කැඳවිය හැකිය.

පාලක මණ්ඩල රැස්වීමක් සඳහා ගණපූරණය සාමාජිකයින් පස් දෙනෙකු වන අතර මුදල් ප්‍රතිපත්ති මණ්ඩල රැස්වීමක් සඳහා ගණපූරණය අධිපතිවරයා හෝ මිල ස්ථායීතාව භාර නියෝජ්‍ය අධිපතිවරයා ඇතුළු ව සාමාජිකයින් අට දෙනෙකු වේ.

මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය සෑම රැස්වීමකින් ම පසුව මෑත කාලීන ආර්ථික ප්‍රවණතා සහ ආර්ථික දැක්ම පිළිබඳ පැහැදිලි කිරීම් සමඟ මුදල් ප්‍රතිපත්ති තීරණ ප්‍රකාශයට පත් කරයි.

# පාලනය




* රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවේ කටයුතු 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කරන ලද අතර 2026 ජනවාරි 01 දින සිට රජයේ ණය කළමනාකරණ මෙහෙයුම් කටයුතුවල සම්පූර්ණ වගකීම රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය වෙත පවරන ලදි.

** 2026 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව මූල්‍ය සමාවේශන දෙපාර්තමේන්තුව ලෙස නම් කරන ලදි.

## මණ්ඩල අනු කමිටු

ශ්‍රී ලංකා මහ බැංකුවේ පාලනය ශක්තිමත් කිරීමට හා මෙහෙයුම් අධීක්ෂණය සහතික කිරීමට පාලක මණ්ඩලය යටතේ විශේෂයෙන් පිහිටුවන ලද මණ්ඩල අනු කමිටු කිහිපයක් ඇත. ඒවා නම්,

- විගණන කමිටුව
- මණ්ඩල අවදානම් අධීක්ෂණ කමිටුව
- මණ්ඩල මානව සම්පත් සහ වැටුප් කමිටුව
- ආචාර ධර්ම කමිටුව

## ප්‍රතිපත්ති හා සම්බන්ධිත අනෙකුත් කමිටු

ශ්‍රී ලංකා මහ බැංකුව ආර්ථික විශ්ලේෂණය සඳහා කැප වූ කොන්දේසි හා ප්‍රතිපත්තිමය ගැටලු පිළිබඳ උපදෙස් දීමට ද කමිටු ස්ථාපනය කර ඇත එනම්

- මුදල් ප්‍රතිපත්ති කමිටුව
- මූල්‍ය පද්ධති ස්ථායීතා කමිටුව

## අධීක්ෂණ, කළමනාකරණ හා මෙහෙයුම් කමිටු

අධීක්ෂණ හා කළමනාකරණ කමිටු ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ සහ මෙහෙයුම් කටයුතු අධීක්ෂණය සඳහා සහාය දක්වයි. එම කමිටුවලට ඇතුළත් වන්නේ,

- ආයතනික කළමනාකරණ කමිටුව
- තොරතුරු තාක්ෂණ අධීක්ෂණ කමිටුව
- ආයෝජන අධීක්ෂණ කමිටු
  - අභ්‍යන්තර ආයෝජන අධීක්ෂණ කමිටුව
  - ජාත්‍යන්තර සංචිත ආයෝජන අධීක්ෂණ කමිටුව
  - සේවක අර්ථසාධක අරමුදල් ආයෝජන අධීක්ෂණ කමිටුව
- මූල්‍ය අවදානම් කළමනාකරණ කමිටුව
- මූල්‍ය නොවන අවදානම් කළමනාකරණ කමිටුව

මෙහෙයුම් කටයුතු සඳහා පහත කමිටු සහාය වෙති.

### මෙහෙයුම් කමිටු

- වෙළෙඳපොළ මෙහෙයුම් කමිටුව
- මානව ප්‍රාග්ධන කමිටුව
- සුවතා කමිටුව
- ව්‍යාපාර අඛණ්ඩතා සැලසුම්කරණ කමිටුව

## ජාතික මට්ටමේ කමිටු

ශ්‍රී ලංකා මහ බැංකුව මූල්‍ය අංශ සංවර්ධනය හා ස්ථාවරත්වය ප්‍රවර්ධනය කරන ප්‍රධාන ජාතික කමිටුවලට ද දායක වේ.

- රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය, මුදල් ප්‍රතිපත්තිය සහ මූල්‍ය පද්ධති ස්ථායීතා ප්‍රතිපත්ති සම්බන්ධීකරණ කවුන්සිලය
- මූල්‍ය අංශ අධීක්ෂණ කමිටුව
- අර්බුද කළමනාකරණ කමිටුව
- මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික කවුන්සිලය
- ජාතික ගෙවීම් කවුන්සිලය
- මුදල් විශුද්ධිකරණය වැළැක්වීම හා ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ ජාතික සම්බන්ධීකරණ කමිටුව
- තිරසර මූල්‍ය ඉදිරි දැක්ම ක්‍රියාත්මක කිරීම සඳහා වන පාර්ශ්වකරුවන්ගේ කමිටුව

### චර්යාධර්ම සංග්‍රහය

ශ්‍රී ලංකා මහ බැංකුවේ චර්යා ධර්ම සංග්‍රහය මණ්ඩල, සාමාජිකයින් හා සේවකයින් අතර සුපිළිපන් බව, වෘත්තීයභාවය සහ සදාචාරාත්මක හැසිරීම ප්‍රවර්ධනය කරයි.

මෙම සංග්‍රහය මගින් වෘත්තීය ක්‍රියාකාරකම්වල දී පවත්වා ගත යුතු ඉහළ ආචාර ධර්ම ප්‍රමිතීන්, බැඳියාවන් අතර ගැටුම් හෙළිදරව් කිරීම සහ රාජකාරියට අදාළ පොදු නොවන තොරතුරුවල දැඩි රහස්‍යභාවය සුරැකීම තහවුරු කර තිබේ. සේවක හැසිරීම සඳහා වෘත්තීයභාවය සහ වගවීම, මූලික වන අතර අදාළ සියලුම නීති, රෙගුලාසි සහ අභ්‍යන්තර ප්‍රතිපත්ති සමඟ දැඩි අනුකූලතාවකින් යුතුව කටයුතු කිරීමේ අවශ්‍යතාව ද දක්වා ඇත.

### දෘෂ්කෘත නිවේදන ප්‍රතිපත්තිය (whistleblowing policy)

මහ බැංකුවේ දෘෂ්කෘත නිවේදන ප්‍රතිපත්තිය හරහා ආචාර ධර්ම විරෝධී හැසිරීම්, අයථා ක්‍රියාකාරකම් රහසිගත ව වාර්තා කිරීමට එහි සේවකයින්ට ඉඩ ප්‍රස්ථාවක් ලබා දී ඇති අතර එය විනිවිදභාවය සහ වගවීමේ පරිසරය තවදුරටත් ප්‍රවර්ධනය කිරීමට හේතු වී ඇත. යහපත් විශ්වාසයකින් ක්‍රියා කරන හා රහස් හෙළි කරන්නන්, පළිගැනීම් සහ වෙනස්කම්වලට භාජනය වීමෙන් වළක්වන අතර සියලුම වාර්තා කිරීම් අවශ්‍ය පරිදි සුදුසු පිළියම් ක්‍රියාමාර්ග සමඟ පරිපූර්ණ සහ අපක්ෂපාතී පරීක්ෂණයකට යටත් වේ.

### දත්ත පාලනය

මහ බැංකුව එහි දත්තවල සංවේදීතාව සැලකිල්ලට ගෙන එහි තොරතුරුවල විශ්වසනීයත්වය සහ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා දත්ත පාලනයට ප්‍රමුඛත්වය දෙයි. ඒ අනුව නිවැරදි, සම්පූර්ණ සහ විශ්වසනීය දත්ත එහි දත්ත කළමනාකරණ ප්‍රතිපත්ති රාමුවට ඇතුළත් වේ. එසේම දත්ත ආරක්ෂණ නීතිවලට අනුකූල වීම අත්‍යවශ්‍ය වන අතර දත්ත ආරක්ෂණ පියවර තුළින් දත්ත සඳහා අනවසර ප්‍රවේශය, උල්ලංඝනය කිරීම් මෙන්ම වෙනත් තර්ජනවලින් දත්ත ආරක්ෂා කිරීමට ද කටයුතු යොදා ඇත. අදාළ තනතුරු සහ ඒවායේ වගකීම් මත පදනම් ව සංවේදී තොරතුරු වෙත ප්‍රවේශ වීම දැඩි ලෙස නියාමනය කරනු ලැබේ.

# මණ්ඩල අනු කමිටු

## විගණන කමිටුව (AC)

**අරමුණ හා කාර්යය**

ව්‍යුහාත්මක හා ක්‍රමානුකූල ආකාරයකින් උපදෙස් හා මග පෙන්වීම් ලබා දීමේ දී විනිවිදභාවය හා වගවීම සහතික කිරීම. 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 103 වන වගන්තිය අනුව අභ්‍යන්තර විගණන කාර්යය, මූල්‍ය ප්‍රකාශවල සුපිළිපන්බව, බාහිර විගණකවරුන් හා සම්බන්ධව කටයුතු කිරීම, දෘෂ්කෘත නිවේදන, අනුකූලතාව සහ වංචා වාර්තා කිරීම ඇතුළු අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් ඇගයීම හා අභ්‍යන්තර විගණන නිර්දේශවලට ඇති අනුකූලතාව සහ අවදානම් කළමනාකරණ රාමුවෙහි ඵලදායීත්වය අධීක්ෂණය කිරීම.

**සංයුතිය**

**මනිල් ජයසිංහ මහතා**
සභාපති

**ආචාර්ය රවීන්ද්‍ර රත්නායක**
සාමාජික

**මෛත්‍රී වික්‍රමසිංහ මහතා**
සාමාජික

## මණ්ඩල අවදානම් අධීක්ෂණ කමිටුව (BROC)

**අරමුණ හා කාර්යය**

පාලක මණ්ඩලය විසින් ලබාදෙන නිල බලය අනුව, මහ බැංකුව පුරා ක්‍රියාත්මක වන ආයතනික මට්ටමේ අවදානම් කළමනාකරණ රාමුව (Enterprise-wide Risk Management Framework) සහ අනුකූලතා කාර්යයන් ක්‍රියාත්මක කිරීම හා ඒවායේ ප්‍රගතිය අධීක්ෂණය කිරීම.

ශ්‍රී ලංකා මහ බැංකුවේ අවදානම් පාලන රාමුවට අනුකූලව, ජාත්‍යන්තරව පිළිගත් ප්‍රමිතීන් සහ මාර්ගෝපදේශයන් අනුව අවදානම් කළමනාකරණය හා අනුකූලතා ක්‍රියාවලීන් සඳහා විශේෂ අවධානයක් යොමු කරමින්, ඒ සම්බන්ධයෙන් පුළුල් ප්‍රතිපත්ති හා උපායමාර්ග ස්ථාපිත කිරීම.

**සංයුතිය**

**නිහාල් ෆොන්සේකා මහතා**
සභාපති

**ට්‍රෙවීන් ජයසේකර මහතා**
බාහිර සාමාජික

**රනෙල් විජේසිංහ මහතා**
බාහිර සාමාජික

## ආචාර ධර්ම කමිටුව (EC)

**අරමුණ හා කාර්යය**

2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 22 සහ 25 වගන්ති යටතේ අවශ්‍යතා සපුරාලන ආචාරධර්ම, නියාමන අවශ්‍යතා සහ යහ පාලන භාවිතයන් සමග ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රතිපත්ති, තීරණ සහ මෙහෙයුම් අනුකූල වන බව සහතික කිරීම සඳහා උපදේශක සහ අධීක්ෂණ මණ්ඩලයක් ලෙස ක්‍රියා කිරීම.

**සංයුතිය**

**අනුෂ්ක විජේසිංහ මහතා**
සභාපති

**ආචාර්ය රවීන්ද්‍ර රත්නායක**
සාමාජික

**අමල් කබ්රාල් මහතා**
බාහිර සාමාජික

**සියලුම නියෝජ්‍ය අධිපතිවරු**

## මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව

**අරමුණ හා කාර්යය**

මහ බැංකුවෙහි පාරිශ්‍රමික රාමුව, උපායමාර්ගික අරමුණුවලට අනුගතව වගවන, ඉහළ දක්ෂතා සහිත පුද්ගලයින් ආකර්ෂණය කර රඳවා ගැනීමට හා අභිප්‍රේරණය කිරීමට හැකිවන ලෙස සකස් කිරීම සඳහා පාලක මණ්ඩලයට උපදෙස් දීම හා නිර්දේශ ඉදිරිපත් කිරීම.

**සංයුතිය**

**නිහාල් ෆොන්සේකා මහතා**
සභාපති

**විශ්වනාදමූර්ති ගෝවින්දසාමි මහතා**
සාමාජික

**මනිල් ජයසිංහ මහතා**
සාමාජික

**චන්ද්‍රසිරි හේවාපත්තිනි මහතා**
බාහිර සාමාජික

පාලනය

## ප්‍රතිපත්ති හා සම්බන්ධිත අනෙකුත් කමිටු

### මුදල් ප්‍රතිපත්ති කමිටුව

**අරමුණ හා කාර්යය**

සාර්ව ආර්ථික ප්‍රවණතාවන් සහ පුරෝකථන ඇගයීම සහ අනාගත මුදල් ප්‍රතිපත්ති දිශානතීන් පිළිබඳ නිර්දේශ මුදල් ප්‍රතිපත්ති මණ්ඩලයේ සලකා බැලීම සඳහා ඉදිරිපත් කිරීම.

**සංයුතිය**

මහ බැංකු අධිපති (සභාපති)

සියලුම නියෝජ්‍ය අධිපතිවරු, සහකාර අධිපතිවරු සහ ආර්ථික පර්යේෂණ, සංඛ්‍යාන, වෙළෙඳපොළ මෙහෙයුම් යන දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් සහ මුදල් සහ බැංකු අංශ අධීක්ෂණය කරන ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ

### මූල්‍ය පද්ධති ස්ථායීතා කමිටුව

**අරමුණ හා කාර්යය**

සාමාජිකයන් හා අනෙකුත් පාර්ශ්වකරුවන් විසින් ඉස්මතු කරන ලද මූල්‍ය පද්ධති ස්ථායීතාව හා සම්බන්ධ කරුණු ඇගයීම, මූල්‍ය පද්ධතියේ අවදානම අධීක්ෂණය කිරීම සහ තාක්ෂණික කරුණු මත පදනම් ව සාමාජිකයින් විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව එම අවදානම් අවම කිරීම සඳහා පාලක මණ්ඩලයට නිර්දේශ ඉදිරිපත් කිරීම.

**සංයුතිය**

මූල්‍ය පද්ධති ස්ථායීතාව භාර නියෝජ්‍ය අධිපති (සභාපති)

සාර්ව විචක්ෂණතා අධ්‍යයන භාර නියෝජ්‍ය අධිපති, මිල ස්ථායීතාව භාර නියෝජ්‍ය අධිපති සහ සාර්ව විචක්ෂණතා අධ්‍යයන, බැංකු අධීක්ෂණ, බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ, ආර්ථික පර්යේෂණ, තැන්පතු රක්ෂණ හා නිරාකරණ, ගෙවීම් සහ පියවීම් යන දෙපාර්තමේන්තු භාර සහකාර අධිපතිවරු හා එම දෙපාර්තමේන්තු ප්‍රධානීන්

## අධීක්ෂණ/කළමනාකරණ/මෙහෙයුම් කමිටු

### ආයතනික කළමනාකරණ කමිටුව

**අරමුණ හා කාර්යය**

බැංකුවේ මානව ප්‍රාග්ධන නිපුණතාව සහ එහි තිරසරභාවයට බලපාන ප්‍රතිපත්ති යෝජනා පිළිබඳ ව පාලක මණ්ඩලයට නිර්දේශ ඉදිරිපත් කිරීම සහ ආයතනික කාර්යයන් සම්බන්ධ ගැටලු විසඳීම. තාක්ෂණික කරුණු මත පදනම් ව පාලක මණ්ඩලය විසින් ඇතැම් තීරණ ගැනීමේ බලය ආයතනික කළමනාකරණ කමිටුව වෙත ලබා දී ඇත.

**සංයුතිය**

අධිපති (සභාපති)

සියලුම නියෝජ්‍ය අධිපතිවරු සහ සහකාර අධිපතිවරු

### තොරතුරු තාක්ෂණ අධීක්ෂණ කමිටුව

**අරමුණ හා කාර්යය**

බැංකුවේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ රාමුව ආයතනික ඉලක්ක සමඟ අනුගත වන ලෙස උපායමාර්ගික දිශානතියකට යොමු කිරීම සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි සමාලෝචනය කර පාලක මණ්ඩලය වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම.

**සංයුතිය**

තොරතුරු තාක්ෂණ භාර නියෝජ්‍ය අධිපති (සභාපති)

සියලුම සහකාර අධිපතිවරු සහ තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ

### ආයෝජන අධීක්ෂණ කමිටු

**අරමුණ හා කාර්යය**

පුළුල් ආයෝජන තීරණ ගැනීමේ දී ආයෝජන මාර්ගෝපදේශවලට අනුකූල වීම තහවුරු කිරීම, ආයෝජන ප්‍රතිපත්ති සහ මාර්ගෝපදේශ සකස් කිරීමට සහ සමාලෝචනය කිරීමට අවශ්‍ය තොරතුරු සැපයීම, පාලක මණ්ඩලයේ උපායමාර්ගික තීරණ මෙහෙයුම් නියෝග බවට පරිවර්තනය කිරීම, අරමුදල් කළමනාකරණ දෙපාර්තමේන්තු විසින් සිදු කරනු ලබන ආයෝජන කටයුතු අධීක්ෂණය කිරීම, නව ණය නිකුත් කිරීම කරන්නන්/ප්‍රතිපාර්ශ්වයන් අනුමත කිරීම, ආයෝජන කාර්ය සාධනය, අවදානම සහ අනුකූලතා අධීක්ෂණය, විශේෂයෙන් නොවැළැක්විය හැකි අවස්ථාවන්හි දී ප්‍රතිපත්ති සහ මාර්ගෝපදේශ සඳහා අවශ්‍ය විචලනයන් නිර්දේශ කිරීම.

**සංයුතිය**

අදාළ දෙපාර්තමේන්තු භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපති/නියෝජ්‍ය අධිපති (සභාපති)

ආයෝජන ප්‍රතිපත්ති ප්‍රකාශනවල දක්වා ඇති පරිදි අදාළ දෙපාර්තමේන්තු අධීක්ෂණය කරන සහකාර අධිපති

### මූල්‍ය නොවන අවදානම් කළමනාකරණ කමිටුව

**අරමුණ හා කාර්යය**

මෙහෙයුම් සහ අනුකූලතා අවදානම් කළමනාකරණයට සුදුසු රාමුවක් ශ්‍රී ලංකා මහ බැංකුව සතු බව සහතික කිරීම සහ මෙහෙයුම් සහ අනුකූලතා අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය පාලක මණ්ඩල අනුමත ප්‍රතිපත්ති, ක්‍රමවේද සහ මාර්ගෝපදේශවලට අනුකූල ව ක්‍රියාත්මක වන බව අධීක්ෂණය කිරීම.

**සංයුතිය**

පාලක මණ්ඩලය විසින් පත් කරන ලද ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපති/නියෝජ්‍ය අධිපති (සභාපති)

ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපති, සියලු නියෝජ්‍ය අධිපතිවරු, සියලු සහකාර අධිපතිවරු, අවදානම් කළමනාකරණය සහ අනුකූලතා අධ්‍යක්ෂ/ප්‍රධාන අවදානම් නිලධාරී, ප්‍රධාන අනුකූලතා නිලධාරී

## මූල්‍ය අවදානම් කළමනාකරණ කමිටුව

**අරමුණ හා කාර්යය**

මහ බැංකුවෙහි මූල්‍ය ස්ථායීතාවට බලපාන වෙළෙඳපොළ, ණය, ද්‍රවශීලතා සහ අනෙකුත් අවදානම්, අනුමත අවදානම් සීමාව තුළ පවතින බව අධීක්ෂණය කිරීම සහ සහතික කිරීම.

**සංයුතිය**

මූල්‍ය දෙපාර්තමේන්තුව අධීක්ෂණය කරන නියෝජ්‍ය අධිපති (සභාපති)

දේශීය මිල ස්ථායීතාව හා මූල්‍ය පද්ධති ස්ථායීතාව භාර නියෝජ්‍ය අධිපතිවරු, දේශීය මිල ස්ථායීතා හා මූල්‍ය පද්ධති ස්ථායීතා දෙපාර්තමේන්තු භාර සියලුම සහකාර අධිපතිවරුන් සහ මූල්‍ය දෙපාර්තමේන්තුව භාර සහකාර අධිපති

ඡන්දය ප්‍රකාශ නොකරන සාමාජිකයින්: ආර්ථික පර්යේෂණ, වෙළෙඳපොළ මෙහෙයුම් සහ ආයෝජන කළමනාකරණ දෙපාර්තමේන්තුවල ප්‍රධානීන්, අවදානම් කළමනාකරණය සහ අනුකූලතා අධ්‍යක්ෂ/ප්‍රධාන අවදානම් නිලධාරි, ප්‍රධාන ගණකාධිකාරි සහ ප්‍රධාන අභ්‍යන්තර විගණක

## වෙළෙඳපොළ මෙහෙයුම් කමිටුව

**අරමුණ හා කාර්යය**

මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයට අනුකූල ව බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් පොලී අනුපාතිකය අපේක්ෂිත මට්ටමේ පවත්වා ගනිමින් අන්තර් බැංකු මුදල් වෙළෙඳපොළෙහි රුපියල් ද්‍රවශීලීතාව කළමනාකරණය කිරීම සහ නම්‍යශීලී විනිමය අනුපාතික තන්ත්‍රයට අනුකූල ව දේශීය විදේශ විනිමය වෙළෙඳපොළ මෙහෙයුම් කටයුතු සඳහා සුදුසු ක්‍රියාමාර්ග පිළිබඳ ව නිර්දේශ දෛනිකව ඉදිරිපත් කිරීම.

**සංයුතිය**

මිල ස්ථායීතා පද්ධති භාර නියෝජ්‍ය අධිපති (සභාපති)

ආර්ථික පර්යේෂණ සහ වෙළෙඳපොළ මෙහෙයුම් දෙපාර්තමේන්තු භාර සහකාර අධිපතිවරු සහ එම දෙපාර්තමේන්තු ප්‍රධානීන්

## මානව ප්‍රාග්ධන කමිටුව

**අරමුණ හා කාර්යය**

බැංකුවේ මානව ප්‍රාග්ධන අවශ්‍යතා ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය උපදෙස් හා උපායමාර්ගික දිශානතිය පෙන්වා දීම සහ ඒ සම්බන්ධයෙන් ආයතනික කළමනාකරණ කමිටුව වෙත අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීම.

**සංයුතිය**

මානව සම්පත් භාර නියෝජ්‍ය අධිපති (සභාපති)

මානව සම්පත් භාර සහකාර අධිපති, ප්‍රධාන මානව සම්පත් නිලධාරි, මානව සම්පත් උපායමාර්ග ප්‍රතිසංස්කරණ ව්‍යාපෘති අධ්‍යක්ෂ, මානව සම්පත්, බැංකු විදු පියෙස, ප්‍රතිපත්ති සමාලෝචන සහ නිරීක්ෂණ, කාර්ය මණ්ඩල සේවා කළමනාකරණ, අවදානම් කළමනාකරණය සහ අනුකූලතා, සන්නිවේදන, ලේකම් යන දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් සහ අදාළ සහකාර අධිපතිවරුන් විසින් පත් කරන ලද නිත්‍ය නොවන සාමාජිකයින් හතර දෙනෙකු

## සුවතා කමිටුව

**අරමුණ හා කාර්යය**

කාර්ය මණ්ඩලයේ සුව සාධනය ආරක්ෂා කරමින් සුරක්ෂිත සේවා ස්ථානයක් සහ සෞඛ්‍ය සම්පන්න කාර්ය මණ්ඩලයක් බිහි කිරීම.

**සංයුතිය**

කාර්ය මණ්ඩල සේවා කළමනාකරණ භාර නියෝජ්‍ය අධිපති (සභාපති)

කාර්ය මණ්ඩල සේවා කළමනාකරණ, පහසුකම් කළමනාකරණ, ආරක්ෂක සේවා, මානව සම්පත් (ප්‍රධාන මානව සම්පත් නිලධාරි ඇතුළු ව), බැංකු විදු පියෙස, ප්‍රතිපත්ති සමාලෝචන හා නිරීක්ෂණ, අවදානම් කළමනාකරණය හා අනුකූලතා හා නීති දෙපාර්තමේන්තු ප්‍රධානීන්

## ව්‍යාපාර අඛණ්ඩතා සැලසුම්කරණ කමිටුව

**අරමුණ හා කාර්යය**

පෙර සූදානම් බව ශක්තිමත් කිරීම, ඔරොත්තු දීමේ හැකියාව ඉහළ නැංවීම සහ අර්බුදකාරී වාතාවරණයක දී නිසි අවස්ථාවේ දී ප්‍රතිචාර දැක්වීම සම්බන්ධීකරණය කිරීම මඟින් ශ්‍රී ලංකා මහ බැංකුවේ අත්‍යවශ්‍ය මෙහෙයුම් කටයුතු අඛණ්ඩ ව සිදු කරන බව සහතික කිරීම.

ව්‍යාපාර අඛණ්ඩතා සැලසුම්කරණය අධීක්ෂණය කිරීම, මෙහෙයුම් කටයුතුවල ස්ථායීතාවට එල්ල විය හැකි අවදානම් නිරීක්ෂණය කිරීම මෙන්ම අර්බුදකාරී තත්ත්වයන් යටතේ වුව ද මහ බැංකුවට තම කටයුතු ඵලදායී ලෙස ඉටුකළ හැකි බව සහතික කිරීම.

**සංයුතිය**

ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව භාර නියෝජ්‍ය අධිපති (සභාපති)

ගෙවීම් සහ පියවීම්, තොරතුරු තාක්ෂණ, පහසුකම් කළමනාකරණ, ආරක්ෂක සේවා, මානව සම්පත්, මූල්‍ය හා ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තු ප්‍රධානීන්

# පාලක මණ්ඩල හා මුදල් ප්‍රතිපත්ති මණ්ඩල සාමාජිකයින්



## පාලනය > පාලක මණ්ඩල හා මුදල් ප්‍රතිපත්ති මණ්ඩල සාමාජිකයින්



2025 දෙසැම්බර් 31 දිනට

**පාලනය > පාලක මණ්ඩල හා මුදල් ප්‍රතිපත්ති මණ්ඩල සාමාජිකයින්**



### නන්දලාල් වීරසිංහ

**අධිපති/ප්‍රධාන විධායක නිලධාරි**

ආර්ථික විද්‍යාව පිළිබඳ ආචාර්ය උපාධිය, ඕස්ට්‍රේලියානු ජාතික විශ්ව විද්‍යාලය

ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය, ඕස්ට්‍රේලියානු ජාතික විශ්ව විද්‍යාලය
විද්‍යාවේදී උපාධිය, කැලණිය විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව

**ශ්‍රී ලංකා මහ බැංකුවේ වත්මන් තනතුරු:**

- සභාපති - පාලක මණ්ඩලය
- සභාපති - මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය
- 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනත යටතේ නම් කරන ලද නිලධාරියා - ශ්‍රී ලංකා මහ බැංකුව



### නිහාල් ෆොන්සේකා

**මණ්ඩල සාමාජික**

විද්‍යාවේදී උපාධිය, ලංකා විශ්ව විද්‍යාලය, කොළඹ, ශ්‍රී ලංකාව

ජ්‍යෙෂ්ඨ සාමාජික, බැංකුකරුවන්ගේ වරලත් ආයතනය, එක්සත් රාජධානිය

ගරු සාමාජික, සුරැකුම්පත් සහ ආයෝජන පිළිබඳ වරලත් ආයතනය, එක්සත් රාජධානිය

**ශ්‍රී ලංකා මහ බැංකුවේ වත්මන් තනතුරු:**

- පත් කළ සාමාජික - පාලක මණ්ඩලය
- පත් කළ සාමාජික - මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය
- සභාපති - පාලක මණ්ඩල අවදානම් අධීක්ෂණ කමිටුව
- සභාපති - මණ්ඩල මානව සම්පත් සහ වේතන කමිටුව



### රවීන්ද්‍ර රත්නායක

**මණ්ඩල සාමාජික**

ආර්ථික විද්‍යාව පිළිබඳ ආචාර්ය උපාධිය, ලා ට්‍රෝබ් විශ්ව විද්‍යාලය, ඕස්ට්‍රේලියාව

ආර්ථික සංවර්ධනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව, කොළඹ විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව

ආර්ථික විද්‍යාව පිළිබඳ කලාවේදී උපාධිය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව

**ශ්‍රී ලංකා මහ බැංකුවේ වත්මන් තනතුරු:**

- පත් කළ සාමාජික - පාලක මණ්ඩලය
- පත් කළ සාමාජික - මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය
- සාමාජික - විගණන කමිටුව
- සාමාජික - ආචාර ධර්ම කමිටුව



### අනුෂ්ක විජේසිංහ

**මණ්ඩල සාමාජික**

ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය, ලීඩ්ස් විශ්ව විද්‍යාලය, එක්සත් රාජධානිය

ආර්ථික විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය, යුනිවර්සිටි කොලේජ් ලන්ඩන්, එක්සත් රාජධානිය

**ශ්‍රී ලංකා මහ බැංකුවේ වත්මන් තනතුරු:**

- පත් කළ සාමාජික - පාලක මණ්ඩලය
- පත් කළ සාමාජික - මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය
- සභාපති - ආචාර ධර්ම කමිටුව



### විශ්වනාදමූර්ති ගෝවින්දසාමි

**මණ්ඩල සාමාජික**

විදුලි ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය, හාර්ට්ෆර්ඩ් විශ්ව විද්‍යාලය, එක්සත් ජනපදය

ජ්‍යෙෂ්ඨ සාමාජික, සහතිකලත් වෘත්තීය කළමනාකරුවන්ගේ ආයතනය, ශ්‍රී ලංකාව

**ශ්‍රී ලංකා මහ බැංකුවේ වත්මන් තනතුරු:**

- පත් කළ සාමාජික - පාලක මණ්ඩලය
- පත් කළ සාමාජික - මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය
- සාමාජික - මණ්ඩල මානව සම්පත් සහ වේතන කමිටුව



### මනිල් ජයසිංහ

**මණ්ඩල සාමාජික**

ජ්‍යෙෂ්ඨ සාමාජික, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය

ජ්‍යෙෂ්ඨ සාමාජික, වරලත් කළමනාකරණ ගණකාධිකාරි ආයතනය, එක්සත් රාජධානිය

ජ්‍යෙෂ්ඨ සාමාජික, ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරි ආයතනය

සාමාජික, වරලත් රාජ්‍ය මූල්‍ය හා ගණකාධිකරණ ආයතනය

**ශ්‍රී ලංකා මහ බැංකුවේ වත්මන් තනතුරු:**

- පත් කළ සාමාජික - පාලක මණ්ඩලය
- පත් කළ සාමාජික - මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය
- සභාපති - විගණන කමිටුව
- සාමාජික - මණ්ඩල මානව සම්පත් සහ වේතන කමිටුව



### මෛත්‍රී වික්‍රමසිංහ

**මණ්ඩල සාමාජික**

ජනාධිපති උපදේශක
ජ්‍යෙෂ්ඨ සාමාජික, කළමනාකරණ ගණකාධිකාරීවරුන්ගේ වරලත් ආයතනය, එක්සත් රාජධානිය

නීතිවේදී උපාධිය (ගෞරව),
කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

**ශ්‍රී ලංකා මහ බැංකුවේ වත්මන් තනතුරු:**
- පත් කළ සාමාජික - පාලක මණ්ඩලය
- පත් කළ සාමාජික - මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය
- සාමාජික - විගණන කමිටුව



### දුෂ්නි වීරකෝන්

**මණ්ඩල සාමාජික**

ආර්ථික විද්‍යාව පිළිබඳ ආචාර්ය උපාධිය,
මැන්චෙස්ටර් විශ්ව විද්‍යාලය, එක්සත් රාජධානිය

ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය,
මැන්චෙස්ටර් විශ්ව විද්‍යාලය, එක්සත් රාජධානිය

ආර්ථික විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය,
බෙල්ෆාස්ට්හි රැජින විශ්ව විද්‍යාලය, එක්සත් රාජධානිය

**ශ්‍රී ලංකා මහ බැංකුවේ වත්මන් තනතුරු:**
- පත් කළ සාමාජික - මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය



### ප්‍රියංග දුනුසිංහ

**මණ්ඩල සාමාජික**

ආර්ථික විද්‍යාව පිළිබඳ මහාචාර්ය, ආර්ථික විද්‍යා අධ්‍යනාංශය, කොළඹ විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව

**ශ්‍රී ලංකා මහ බැංකුවේ වත්මන් තනතුරු:**
- පත් කළ සාමාජික - මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය



### චන්ද්‍රනාත් අමරසේකර

**නියෝජ්‍ය අධිපති**

ආර්ථික විද්‍යාව පිළිබඳ ආචාර්ය උපාධිය,
මැන්චෙස්ටර් විශ්ව විද්‍යාලයේ, එක්සත් රාජධානිය

ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය,
මැන්චෙස්ටර් විශ්ව විද්‍යාලය, එක්සත් රාජධානිය

ආර්ථික විද්‍යාව පිළිබඳ කලාවේදී උපාධිය
පේරාදෙණිය විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව

**ශ්‍රී ලංකා මහ බැංකුවේ වත්මන් තනතුරු:**
- සාමාජික - මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය
- සාමාජික - ආචාර ධර්ම කමිටුව



### සිරිකුමාර කුඩාගම

**නියෝජ්‍ය අධිපති**

නීතිපති උපාධිය,
මොනෑෂ් විශ්ව විද්‍යාලය, ඕස්ට්‍රේලියාව

නීතිපති උපාධිය,
කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

නීතිවේදී උපාධිය,
කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

**ශ්‍රී ලංකා මහ බැංකුවේ වත්මන් තනතුරු:**
- සාමාජික - මුදල් ප්‍රතිපත්ති මණ්ඩල
- සාමාජික - ආචාර ධර්ම කමිටුව

# ආයතනික කළමනාකාරිත්වය



**රුවනි ගුණසේකර**
සහකාර අධිපති

**චාමින්ද බණ්ඩාර**
සහකාර අධිපති

**පී කේ ජී හරිස්චන්ද්‍ර**
සහකාර අධිපති (ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට මුදා හැර ඇත)

**චන්ද්‍රනාත් අමරසේකර**
නියෝජ්‍ය අධිපති

**නන්දලාල් වීරසිංහ**
අධිපති


අනුරාධා දිල්රුක්ෂිණී
සහකාර අධිපති
දිමුතු සමරතුංග
සහකාර අධිපති
එනෝකා මොහොට්ටි
සහකාර අධිපති
නෙළුමනී දවුලගල
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපති
සිරිකුමාර කුඩාගම
නියෝජ්‍ය අධිපති
2025 දෙසැම්බර් 31 දිනට

# ප්‍රධාන නිලධාරීන්

## දෙපාර්තමේන්තු ප්‍රධානීන් (2025 දෙසැම්බර් 31 වන දිනට)




මහින්ද ප්‍රනාන්දු
අධ්‍යක්ෂ, අවදානම් කළමනාකරණ සහ අනුකූලතා
සමන් නානායක්කාර
ප්‍රධාන අනුකූලතා නිලධාරි
ඩිලනි කරුණාරත්න
අධ්‍යක්ෂ, තැන්පතු රක්ෂණ හා නිරාකරණ
කල්හාරි මායාදුන්න
ප්‍රධාන අභ්‍යන්තර විගණක
මේනකා ජයවර්ධන
අධ්‍යක්ෂ, බැංකු විදු පියෙස
සිසිර විතාරණ
අධ්‍යක්ෂ, පහසුකම් කළමනාකරණ
ප්‍රියන්ත හේරත්
අධ්‍යක්ෂ, තොරතුරු තාක්ෂණ
චතුර ආරියදාස
අධ්‍යක්ෂ, ප්‍රාදේශීය සංවර්ධන
ප්‍රියන්ත තිලකවීර
අධ්‍යක්ෂ, සාර්ව විචක්ෂණතා අධ්‍යයන
අනිල් පෙරේරා
අධ්‍යක්ෂ, වෙළෙඳපොළ මෙහෙයුම්
සුභානි කීර්තිරත්න
අධ්‍යක්ෂ, මූල්‍ය බුද්ධි ඒකකය
ලසන්ති සිරිමාන්න
ප්‍රධාන ගණකාධිකාරී
රුක්ෂණා ද සිල්වා ජයතිලක
අධ්‍යක්ෂ, බැංකු අධීක්ෂණ
රාජා දයානන්ද
මහ බැංකු ලේකම්
සංජී බාලසූරිය
ප්‍රධාන තොරතුරු ආරක්ෂණ නිලධාරි
2025 දෙසැම්බර් 31 දිනට

## අතිරේක දෙපාර්තමේන්තු ප්‍රධානීන් (2025 දෙසැම්බර් 31 වන දිනට)



**සුරේකා කැටවල**
අතිරේක අධ්‍යක්ෂ, බැංකු අධීක්ෂණ



**ලසන්තා සිරිවර්ධන**
අතිරේක අධිකාරී, සේවක අර්ථසාධක අරමුදල



**ලසිත පත්බේරිය**
අතිරේක අධ්‍යක්ෂ, ආර්ථික පර්යේෂණ



**සුනන්ද ඔබේසේකර**
අතිරේක අධ්‍යක්ෂ, ගෙවීම් සහ පියවීම්



**උදයන්ති තෙන්නකෝන්**
අතිරේක ලේකම්, ලේකම් දෙපාර්තමේන්තුව



**චන්ද්‍රිකා රාජපක්ෂ**
අතිරේක අධිකාරී, සේවක අර්ථසාධක අරමුදල



**ඩිල්හාන් ද සිල්වා**
අතිරේක අධිකාරී, ව්‍යවහාර මුදල්



**ලංකාපති ශ්‍රීධරන්**
අතිරේක අධ්‍යක්ෂ, සාර්ව විචක්ෂණතා අධ්‍යයන



**අයේෂ් ආරියසිංහ**
අතිරේක අධ්‍යක්ෂ, මූල්‍ය බුද්ධි ඒකකය



**ඉඳුනිල් ඒකනායක**
අතිරේක අධ්‍යක්ෂ, බැංකු විදු පියෙස



**චතුර ගමගේ**
අතිරේක අධ්‍යක්ෂ, තොරතුරු තාක්ෂණ



**ප්‍රියංකා වීරසේකර**
අතිරේක ලේකම්, ලේකම් දෙපාර්තමේන්තුව



**එරන්දි වීරසිංහ**
අතිරේක අධ්‍යක්ෂ, බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ



**මනීෂා විමලසූරිය**
අතිරේක අධ්‍යක්ෂ, ගෙවීම් සහ පියවීම්



**සිසිර ජයසේකර**
අතිරේක ප්‍රධාන ගණකාධිකාරී



**විපුල වික්‍රමාරච්චි**
අතිරේක අධ්‍යක්ෂ, ආර්ථික පර්යේෂණ



**නිශාන්ත ජයවීර**
අතිරේක අධ්‍යක්ෂ, ආයෝජන කළමනාකරණ



**මල්කාන්ති වරකාගොඩ**
අතිරේක අධ්‍යක්ෂ, මානව සම්පත්



**නයනා පෙරේරා**
අතිරේක අධිකාරී, සේවක අර්ථසාධක අරමුදල



**මානෙල් දමයන්ති**
අතිරේක අධිකාරී, ව්‍යවහාර මුදල්



**ශාන් කුරින්චිදරන්**
අතිරේක අධ්‍යක්ෂ, බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ



**පවිත්‍රි විතානගේ**
අතිරේක අධ්‍යක්ෂ, නීති



**ඩිලිනි විලත්ගමුව**
අතිරේක අධ්‍යක්ෂ, නීති



**එරන්දි ලියනගේ**
අතිරේක ලේකම්, ලේකම් දෙපාර්තමේන්තුව



**ප්‍රදීපා කුමාරි**
අතිරේක අධ්‍යක්ෂ, බැංකු අධීක්ෂණ



**නිරෝධා මල්ලිකාරච්චි**
අතිරේක අධ්‍යක්ෂ, මානව සම්පත්

# විගණන කමිටු වාර්තාව

**පාලනය, අවදානම් කළමනාකරණය, අනුකූලතාව අභ්‍යන්තර පාලනයන් සහ මූල්‍ය වර්තාකරණයේ ඵලදායීතාව ශක්තිමත් කරමින් විගණන කමිටුව විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ පාලක මණ්ඩලය සහ කළමනාකාරිත්වය වෙත ක්‍රමවත් අධීක්ෂණයක් සහ මග පෙන්වීමක් අඛණ්ඩ ව සපයන ලදි.**

## 1. විගණන කමිටුවේ කාර්යභාරය

ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 103(4) වගන්තියට අනුව විගණන කමිටුවේ බලතල, කාර්ය සහ කර්තව්‍ය යටතට (අ) අභ්‍යන්තර විගණන කර්තව්‍ය අධීක්ෂණය කිරීම (ආ) ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයා විසින් නිකුත් කරන ලද නිරීක්ෂණ සහ නිර්දේශවලට ඇති අනුකූලතාව අධීක්ෂණය කිරීම (ඇ) විගණන නිරීක්ෂණයන් සම්බන්ධයෙන් විගණකවරුන් සමඟ සාකච්ඡා කිරීම (ඈ) විගණකවරුන් සමඟ වාර්ෂික මූල්‍ය ප්‍රකාශ සමාලෝචනය කිරීම ඇතුළත් වේ. ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 103(6) වගන්තියට අනුව පාලක මණ්ඩලය විසින් විගණන කමිටුවේ සංයුතිය සහ බලතල, කාර්ය සහ කර්තව්‍ය ශ්‍රී ලංකා මහ බැංකුවේ විගණන ප්‍රඥප්තියෙහි නිර්වචනය කර ඇත. මෙම නීතිමය පදනම මඟින් ජාත්‍යන්තර යහ පරිචයන් සමඟ අනුගතවන ලෙස ශ්‍රී ලංකා මහ බැංකුවේ පාලනය, අවදානම් කළමනාකරණය, අනුකූලතාව සහ මූල්‍ය වගවීම පිළිබඳ කැපවීම තවදුරටත් ශක්තිමත් කරමින්, අභ්‍යන්තර පාලන ක්‍රමවේද ඵලදායී ලෙස ක්‍රියාත්මක වන බව සහතික කිරීම, නියාමන අනුකූලතාව ප්‍රවර්ධනය කිරීම සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ මෙහෙයුම් පිළිබඳ මහජන විශ්වාසය ප්‍රවර්ධනය කිරීම සඳහා විගණන කමිටුවේ ස්වාධීනත්වය සහ අධීක්ෂණ බලතල තහවුරු කරයි.

2025 වර්ෂය තුළ විගණන කමිටුව, පාලක මණ්ඩලයේ පහත සඳහන් පත් කළ සාමාජිකයන්ගෙන් සමන්විත විය.

i. **මනිල් ජයසිංහ මහතා** - සභාපති

ii. **ආචාර්ය රවින්ද්‍ර රත්නායක** - සාමාජික

iii. **රජීව් අමරසූරිය මහතා** - සාමාජික (2025 ජූනි 27 දක්වා)

iv. **මෛත්‍රී වික්‍රමසිංහ මහතා** - සාමාජික (2025 ඔක්තෝබර් 23 දින සිට)

පාලක මණ්ඩලයේ ලේකම්වරයා විගණන කමිටුවේ ලේකම්වරයා වන අතර ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයා, විගණන කමිටුවේ සහකාර ලේකම් ධුරය දරයි. විගණකාධිපතිවරයාගේ නියෝජිතයකු සියලුම විගණන කමිටු රැස්වීම්වල දී නිරීක්ෂකයෙකු වශයෙන් සහභාගී වේ.

කමිටු සාමාජිකයින් හා රැස්වීම් සඳහා සහභාගි වීම

| | සහභාගි වීම සඳහා සුදුසුකම්ලත්/සහභාගි වූ |
|---|---|
| **මනිල් ජයසිංහ මහතා** - සභාපති | 13/13 |
| **ආචාර්ය රවින්ද්‍ර රත්නායක** - සාමාජික | 13/13 |
| **රජීව් අමරසූරිය මහතා** - සාමාජික | 08/05 |
| **මෛත්‍රී වික්‍රමසිංහ මහතා** - සාමාජික | 02/02 |

## 2. විගණන ප්‍රඥප්තිය

පාලක මණ්ඩලය විසින් අනුමත කරන ලද ශ්‍රී ලංකා මහ බැංකුවේ විගණන ප්‍රඥප්තිය, විගණන කමිටුවේ සංයුතිය, අධිකාරිය, බලතල, කාර්ය සහ කර්තව්‍ය නිර්වචනය කරන අතර පාලනය පිළිබඳ ජාත්‍යන්තර යහ පරිචයන්ට අනුකූලව එහි ඵලදායී ක්‍රියාකාරිත්වය සහතික කරයි. විගණන ප්‍රඥප්තිය බැංකුවේ මෙහෙයුම්වල පාලනය, අනුකූලතාව, අවදානම කළමනාකරණය, අභ්‍යන්තර පාලන පරිසරය සහ මූල්‍ය වාර්තාකරණය පිළිබඳ ස්වාධීන අධීක්ෂණයක් සඳහා අවශ්‍ය ක්‍රමවත් පද්ධතිමය රාමුවක් සපයයි.

එහි අධිකාරි බලය සම්පූර්ණ කිරීම සහ කාර්යයන් ඵලදායී ව සිදු කිරීම සඳහා අවශ්‍ය තොරතුරු, දත්ත, කළමනාකාරිත්වය සහ විගණන වාර්තා වෙත ඇති නිර්බාධි ප්‍රවේශය සඳහා විගණන කමිටුව බල ගන්වා ඇත. එසේ ම වාස්තවික තීරණ ගැනීම සහ දැනුම්වත් පාලනය සඳහා පහසුකම් සැලසීමට, අවශ්‍ය අවස්ථාවන්හි දී ස්වාධීන හා බාහිර උපදේශකයන්ගේ සේවය ලබාගැනීමට අවශ්‍ය අධිකාරි බලය විගණන ප්‍රඥප්තිය මඟින් කමිටුවට ලබා දී ඇත.

මීට අමතරව විගණන ක්‍රියාවලිය කාර්යක්ෂම ව සිදු කිරීම, විගණන නිරීක්ෂණය සඳහා කඩිනමින් ක්‍රියාමාර්ග ගැනීම, උද්ගත වෙමින් පවතින අවදානම් සඳහා පාලන ව්‍යුහයන්ගේ ඇති ඔරොත්තු දීමේ හැකියාව තහවුරු කිරීම සඳහා පාලක මණ්ඩලය සහ අභ්‍යන්තර හා බාහිර විගණකයින්, අනෙකුත් තහවුරු කරන්නන් අතර මනා සම්බන්ධීකරණයක් පවත්වා ගැනීමට විගණන කමිටුව කටයුතු කරයි. මූල්‍ය ප්‍රකාශ අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල ව සත්‍ය හා සාධාරණ ආකාරයට ඉදිරිපත් කර ඇති බව තහවුරු කිරීමේ දී මූල්‍ය වාර්තාකරණය හා සබැඳි කරුණු සම්බන්ධයෙන් කළමනාකාරිත්වය සහ බාහිර විගණකයින් අතර වන එකඟ නොවීම් සමථයට පත් කිරීමට ද කමිටුව බල ගන්වා ඇත. තව ද විගණන ප්‍රඥප්තිය මගින් කමිටුවේ ක්‍රියාකාරීත්වය සඳහා පටිපාටිමය මාර්ගෝපදේශ නියමකර එහි සංයුතිය, ගණපූරණය, රැස්වීම් වාර ගණන, න්‍යාය පත්‍රය සැකසීම, වාර්තාකරණමය අවශ්‍යතා සහ කාර්යසාධන ඇගයීම පිළිබඳ තොරතුරු ඇතුළත් කර ඇත.

විගණන කමිටුව විසින් එහි ක්‍රියාකාරකම්, ප්‍රධාන තීරණ හා නිර්දේශයන් මෙන්ම විගණන නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ කළමනාකාරීත්ව ප්‍රගතිය පිළිබඳ සාරාංශගත වාර්තාවක් සෑම සිව්මසකට වරක් පාලක මණ්ඩලය වෙත ලබා දිය යුතුය. මෙම ව්‍යුහමය වාර්තාකරණ යාන්ත්‍රණය මහ බැංකුවේ මූල්‍යමය සහ මෙහෙයුම් කටයුතුවල ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීම සඳහා වන අඛණ්ඩ අධීක්ෂණය හා වගවීම තහවුරු කරයි.

## 3. විගණන කමිටුව විසින් සිදුකරන ලද ක්‍රියාකාරකම්

### 3.1. අභ්‍යන්තර විගණන කර්තව්‍ය අධීක්ෂණය කිරීම

විගණන කමිටුව විසින් 2025 වසර තුළ දී පහත කටයුතු සිදුකරන ලදි.

i. අභ්‍යන්තර විගණන ප්‍රඥප්තිය සමාලෝචනය කර අනුමත කිරීම

ii. අවදානම් පදනම් කරගත් 2026 වර්ෂය සඳහා වන වාර්ෂික විගණන සැලැස්ම සමාලෝචනය සහ නිර්දේශ කිරීම, සහ අවදානම් පදනම් කරගත් 2025 වර්ෂය සඳහා වන වාර්ෂික විගණන සැලැස්මේ ප්‍රගතිය සමාලෝචනය කිරීම

එමෙන්ම විගණන කමිටුව විසින් පහත සමාලෝචනයන් ද සිදු කරන ලදි.

iii. අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් සිදු කළ විගණනවල ත්‍රෛමාසික ප්‍රගතිය

iv. ක්‍රියාවලි හිමිකරුවන් වෙත ලබා දුන් අභ්‍යන්තර විගණන නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ත්‍රෛමාසික තත්ත්වය

v. කාලානුරූප ස්වයං තක්සේරු වාර්තාව සහ අභ්‍යන්තර විගණන කර්තව්‍ය පිළිබඳ 2024 වසර සඳහා වන අඛණ්ඩ අධීක්ෂණ වාර්තාව

vi. අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ 2026 වසර සඳහා වන ක්‍රියාකාරී සැලැස්ම

vii. අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ 2026 වසර සඳහා වන අයවැය

viii. අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ වාර්ෂික ආචාරධර්ම සංග්‍රහය සහ බැඳියාවන් අතර ගැටීම් ප්‍රකාශනය

ix. අභ්‍යන්තර විගණනය පිළිබඳ වාර්ෂික සේවාදායක ප්‍රතිපෝෂණ සමීක්ෂණයේ ප්‍රතිඵල

### 3.2. මූල්‍ය ප්‍රකාශන සහ බාහිර විගණනය පිළිබඳ සමාලෝචනය

විගණන කමිටුව විසින් වසර තුළ දී පහත සමාලෝචනයන් සිදු කරන ලදි.

i. 2024 මූල්‍ය වර්ෂය සඳහා වන වාර්ෂික ව්‍යවස්ථාපිත විගණනයේ ප්‍රගතිය සහ 2025 මූල්‍ය වර්ෂය සඳහා වන බාහිර විගණනකරුගේ විගණන සැලැස්ම

ii. 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශ

iii. 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන මූල්‍ය වර්ෂය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ බෙදාහැරිය හැකි ලාභය පිළිබඳ නිර්ණය

iv. 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශ විගණනයට අදාළ ව විගණකාධිපතිවරයා විසින් පත් කරන ලද බාහිර විගණකගේ අතුරු කළමනාකාරිත්ව ලිපිය, අවසන් කළමනාකාරිත්ව ලිපිය සහ ඒ සඳහා වූ මහ බැංකු කළමනාකාරිත්වයේ ප්‍රතිචාර

v. 2023 මූල්‍ය වර්ෂය සඳහා බාහිර විගණන නිරීක්ෂණයන් සම්බන්ධයෙන් ගත් ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය

vi. 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශ ඇතුළු ව ශ්‍රී ලංකා මහ බැංකුවේ කටයුතු පිළිබඳ විගණකාධිපතිවරයාගේ කෙටුම්පත් වාර්තාව සහ මහ බැංකුවේ ප්‍රතිචාර

vii. 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශ ඇතුළු ව ශ්‍රී ලංකා මහ බැංකුවේ කටයුතු පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාවට අදාළ ව ගත් ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය

viii. 2024 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ විශ්‍රාම අරමුදල් හයේ (06) මූල්‍ය ප්‍රකාශ

ix. 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමයේ මූල්‍ය ප්‍රකාශ

x. 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මාස තුන සඳහා වූ මූල්‍ය ස්ථායීතා අරමුදලේ මූල්‍ය ප්‍රකාශ

xi. 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වූ සේවක අර්ථසාධක අරමුදලේ මූල්‍ය ප්‍රකාශ

xii. 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා සේවක අර්ථසාධක අරමුදලේ මූල්‍ය ප්‍රකාශ සම්බන්ධයෙන් විගණකාධිපතිවරයාගේ වාර්තාව සහ අදාළ ප්‍රතිචාර

xiii. නව ගිණුම්කරණ ප්‍රමිතීන්, ගිණුම්කරණ ප්‍රතිපත්ති සමාලෝචන ක්‍රියාවලිය සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ නව අපේක්ෂිත ණය හානි ආකෘතිය ප්‍රතිග්‍රහණය කිරීම

### 3.3. අනෙකුත් ක්‍රියාකාරකම් සමාලෝචනය

විගණන කමිටුව විසින් පහත සමාලෝචන සිදු කරන ලදි.

i. ශ්‍රී ලංකා මහ බැංකුවේ විගණන ප්‍රඥප්තිය

ii. ශ්‍රී ලංකා මහ බැංකුවේ තොරතුරු සහ සයිබර් ආරක්ෂණ තත්ත්වය

iii. බැංකුවේ ඉහළ මට්ටමේ විවිධ ප්‍රතිපත්ති සම්බන්ධයෙන් පාලක මණ්ඩලය වෙත ලබා දෙන ලද කමිටුවේ අදහස්

iv. විගණන කමිටුව විසින් දෙපාර්තමේන්තු, කමිටු සහ බැංකුවේ කළමනාකාරිත්වය වෙත තමන් විසින් ලබා දුන් තීරණ ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය

v. ශ්‍රී ලංකා මහ බැංකුවේ අයවැය, අයවැය කාර්යසාධනය සහ මූල්‍ය කාර්යසාධනය

2026 වසර තුළ දී විගණන කමිටුව විසින් 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව, සේවක අර්ථසාධක අරමුදල, ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය සහ මූල්‍ය ස්ථායිතා අරමුදල ආදියෙහි මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කරන ලදි.

මීට අමතර ව 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශ පිළිබඳ ව විගණකාධිපතිවරයා විසින් පත් කරන ලද බාහිර විගණකවරයා විසින් ඉදිරිපත් කරන ලද අතුරු කළමනාකරණ ලිපිය කමිටුව විසින් සමාලෝචනය කරන ලදි.

තවදුරටත් විගණන කමිටුව 2025 වර්ෂයේ දී සිදු කළ ක්‍රියාකාරකම් පිළිබඳ ව 2026 ආරම්භයේ දී ස්වයං-ඇගයීමක් සිදු කරන ලදි.

# අවදානම් කළමනාකරණය සහ අනුකූලතාව

## අවදානම් කළමනාකරණය

දේශීය හා විදේශීය වෙළෙඳපොළ තත්ත්වයන් තුළින් මතුවන අවදානම්වලින් හෙබි පරිසරයක් තුළ ක්‍රියාත්මක වන බැවින් බැංකුවේ පරමාර්ථවලට හෝ කීර්තිනාමයට හානි කළ හැකි මූල්‍ය සහ මූල්‍ය නොවන අවදානම් අවම කිරීම සඳහා සැකසූ පරිපූර්ණ අවදානම් කළමනාකරණ රාමුවක් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුගමනය කිරීම අත්‍යාවශ්‍ය වේ. ශ්‍රී ලංකා මහ බැංකුවේ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ (Risk Management Policy Statement) දක්වා ඇති නියමයන් මත පදනම් ව ගොඩනගන ලද මෙම රාමුව ගෝලීය ප්‍රමිතීන්ට හා මනා පරිචයන්ට සමගාමී වෙමින් විවිධ පාර්ශ්වකරුවන් හරහා ව්‍යුහගත අවදානම් හිමිකාරිත්වය හා වගවීම තහවුරු කරයි. මෙමඟින් සියලු මෙහෙයුම් මට්ටම් සඳහා අවදානම් අවම කිරීමේ උපායමාර්ග ක්‍රියාත්මක කිරීමට ද හැකියාව ලබා දෙයි.

මණ්ඩල අවදානම් අධීක්ෂණ කමිටුව (Board Risk Oversight Committee), පාලක මණ්ඩලයෙන් පැවරෙන විධිමත් අධිකාරිත්වය තුළින් ශ්‍රී ලංකා මහ බැංකුවේ සමස්ත අවදානම් කළමනාකරණ හා අනුකූලතා කාර්යය අධීක්ෂණය කරනු ලබන අතර ශ්‍රී ලංකා මහ බැංකුවට බලපාන ඉදිරියේ දී උද්ගත විය හැකි අවදානම් ප්‍රවණතා ද සමාලෝචනය කරයි.

2025 වර්ෂයේ දී ශ්‍රී ලංකා මහ බැංකුව ආයතනික ප්‍රතිසංස්කරණ න්‍යාය පත්‍රයේ කොටසක් ලෙස ව්‍යවසාය මට්ටමේ අවදානම් කළමනාකරණ (Enterprise-wide Risk) ක්‍රියාවලිය ශක්තිමත් කිරීමේ අරමුණින් ඉහළ සිට පහළ ප්‍රවේශය (Top-down approach) නියෝජනය කරන අවදානම් රුචි රාමුවක් (Risk Appetite Framework) ක්‍රියාත්මක කරන ලදි. මෙම ක්‍රියාවලියේ ප්‍රධාන සන්ධිස්ථානයක් වූයේ ශ්‍රී ලංකා මහ බැංකුව සිය උපායමාර්ගික අරමුණු ඉටු කිරීමෙහිලා දරා ගැනීමට සූදානම් අවදානම්වල මට්ටම් හා ස්වභාවය විධිමත්ව ප්‍රකාශ කරමින් ශ්‍රී ලංකා මහ බැංකුවේ මෙහෙයුම් අවදානම ආවරණය කරන පාලක මණ්ඩලය විසින් අනුමත කරන ලද ප්‍රථම අවදානම් රුචි ප්‍රකාශනය (Risk Appetite Statement) හඳුන්වා දීමයි. මෙය අවදානම් කළමනාකරණයෙහි මූලික වෙනසක් ඇති කරමින් ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්යභාරය හා උපායමාර්ගික ප්‍රමුඛතා අතර සමගාමීතාවක් ඇති කිරීමට හේතු විය.

තව ද ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රතිපත්ති තීරණ ගැනීමට උපකාරී වන ලෙස ශේෂ පත්‍ර අවදානම ඵලදායී හා විචක්ෂණශීලී ලෙස කළමනාකරණය කිරීම සහතික කිරීම සඳහා පාලක මණ්ඩලය විසින් අනුමත කරන ලද ශේෂ පත්‍ර අවදානම් තක්සේරු රාමුව (Balance Sheet-Risk Appetite Framework) ස්ථාපිත කරන ලදි. 2025 වර්ෂයේ දී ශේෂ පත්‍ර අවදානම් තක්සේරු රාමුව යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ ශේෂ පත්‍රය සම්බන්ධ මූල්‍ය අවදානම් අධීක්ෂණය කිරීමට හා පාලක මණ්ඩලයට කාලෝචිත නිර්දේශ ලබා දීමට මූල්‍ය අවදානම් කළමනාකරණ කමිටුව (Financial Risk Management Committee) නමින් නව ආයතනික කළමනාකරණ කමිටුවක් ස්ථාපිත කරන ලදි.

## මෙහෙයුම් අවදානම

ශ්‍රී ලංකා මහ බැංකුව ජාත්‍යන්තර යහ පරිචයන්ට අනුකූල ව පහළ මට්ටමේ සිට ඉහළ මට්ටමට යන අවදානම් පාලන ස්වයං තක්සේරු ක්‍රමවේදය (Risk Control Self-Assessment – RCSA) අඛණ්ඩ ව ක්‍රියාත්මක කරන ලදි. එමඟින් එක් එක් දෙපාර්තමේන්තු පළමු පෙළ අවදානම් හිමිකරුවන් ලෙස ඉටු කරන භූමිකාව තවදුරටත් ශක්තිමත් කර ඇත. මූලාශ්‍රයේ දී ම අවදානම් හඳුනාගැනීම, තක්සේරු කිරීම, කළමනාකරණය කිරීම, සහ වගවීම ප්‍රවර්ධනය කිරීම සඳහා මෙම දෙපාර්තමේන්තු මට්ටමේ අවදානම් තක්සේරු ක්‍රියාවලිය අත්‍යවශ්‍ය වේ. මෙතුළින් මෙහෙයුම් දැනුම වැඩි වශයෙන් ඇති ස්ථානය වන දෙපාර්තමේන්තු තුළදීම අවදානම් හඳුනාගැනීමට හැකියාව ලැබීම නිසා දෛනික තීරණ ගැනීමේ ක්‍රියාවලිය තුළ අවදානම් පිළිබඳ අවබෝධය අන්තර්ගත කිරීම සහ උද්ගත විය හැකි අවදානම් කාලෝචිතව හඳුනාගැනීමට හැකි වේ.

තව ද සිද්ධි වාර්තා කිරීමේ පද්ධතිය (Incident Reporting System) තුළින් මෙම ව්‍යුහය තවදුරටත් ශක්තිමත් කරමින් වාර්තා කරන සිදුවීම් සහ ඒවාට ප්‍රතිචාර ලෙස ක්‍රියාත්මක කරන ලද නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග අධීක්ෂණය කිරීමේ හැකියාව ලබා දේ. මෙම ක්‍රියාවලිය හරහා එකතු වන තොරතුරු මධ්‍යගත අවදානම් දත්ත ගබඩාවක් (centralized risk repository) නිර්මාණය කිරීම සඳහා උපකාර වන අතර එමඟින් අවදානම් කළමනාකරණ ඒකකයට දෙපාර්තමේන්තු අතර අවදානම් ප්‍රවණතා විශ්ලේෂණය කිරීම, පාලන ක්‍රමවේදයන්ගේ කාර්යක්ෂමතාව ඇගයීම, සහ අවදානම් අවම කිරීමේ උපායමාර්ග තවදුරටත් වර්ධනය කිරීම සඳහා සහාය ලබාදේ. දෙපාර්තමේන්තු මට්ටමේ අවදානම් පාලන ස්වයං තක්සේරු ක්‍රියාවලිය සහ සිද්ධි වාර්තා කිරීමේ පද්ධතිය මඟින් ශ්‍රී ලංකා මහ බැංකුවේ අවදානම් මැනවින් කළමනාකරණය කිරීමේ හැකියාව ඉහළ නංවන අතර කරමින් සමස්ත පාලන පරිසරය තවදුරටත් ශක්තිමත් කරයි.

## මූල්‍ය අවදානම්

ශ්‍රී ලංකා මහ බැංකුව ජාත්‍යන්තර සංචිත කළමනාකරණය, දේශීය වෙළෙඳපොළ ද්‍රවශීලතා ක්‍රියාකාරකම් සහ මූල්‍ය ස්ථායීතාව පවත්වා ගැනීම වැනි මූලික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ දී වෙළෙඳපොළ අවදානම් සහ ණය අවදානම් සහිත පරිසරයක් ඇති වේ. මෙවැනි පසුබිමක් තුළ ලෝකයේ බොහෝ මහ බැංකු ශක්තිමත් මූල්‍ය අවදානම් කළමනාකරණ රාමුවක් සහ ශක්තිමත් ප්‍රාග්ධන ප්‍රතිපත්ති ගොඩනැංවීමට වැඩි අවධානයක් යොමු කරනු ලබයි. එයට අනුකූල ව ශේෂපත්‍ර අවදානම් රුචි රාමුව පිහිටුවීමත් සමඟින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සමස්ත අවදානම් කළමනාකරණ රාමුව තවදුරටත් ශක්තිමත් කර ඇති අතර විවිධ අවස්ථා යටතේ ශේෂපත්‍ර යේ හිමිකම් පුරෝකථනය කිරීම සඳහා ආතති පරීක්ෂණ සිදු කරමින් එම පරීක්ෂණවල ප්‍රතිඵල මූල්‍ය අවදානම් කළමනාකරණ කමිටුව, මණ්ඩල අවදානම් අධීක්ෂණ කමිටුව සහ පාලක මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදි.

2025 වර්ෂය තුළ ජාත්‍යන්තර සංචිත (International Reserves&, තැන්පතු රක්ෂණ හා නිරාකරණ දෙපාර්තමේන්තු අරමුදල් (Deposit Insurance and Resolution Department Funds) ඇතුළු අභ්‍යන්තර ආයෝජන අරමුදල් (Internal Investment Funds) සහ සේවක අර්ථසාධක අරමුදල (Employees' Provident Fund) සම්බන්ධ අරමුදල් කළමනාකරණ කටයුතු නියමිත පරිදි සමාලෝචනය කරන ලදි.
ස්ථාපිත පාලන හා අධීක්ෂණ සැලසුම් අනුව සෑම ප්‍රධාන මූල්‍ය හා මූල්‍ය නොවන අවදානමක් ම අදාළ ආයෝජන අධීක්ෂණ කමිටු/මූල්‍ය නොවන අවදානම් කළමනාකරණ කමිටුව වෙත වාර්තා කළ අතර තීරණාත්මක අවස්ථාවල දී මණ්ඩල අවදානම් අධීක්ෂණ කමිටු හරහා පාලක මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදි.

## අනුකූලතා කාර්යය

මහ බැංකුව එයට අදාළ වන නීතිමය, ව්‍යවස්ථාමය සහ ජාත්‍යන්තර ප්‍රමිතීන් හා අනුකූල වීම සහතික කිරීම සඳහා ශක්තිමත් අනුකූලතා රාමුවක් ස්ථාපනය කර ඇත. එමඟින් ආයතනය තුළ ශක්තිමත් අනුකූලතා සංස්කෘතියක් ප්‍රවර්ධනය කෙරේ.

සියලුම දෙපාර්තමේන්තු තමන්ට අදාළ කාර්යයන්ගෙන් පැන නඟින අනුකූලතා අවදානම් හඳුනා ගැනීම, අවම කිරීම සහ ස්ථාපිත යාන්ත්‍රණයන් හරහා වාර්තා කිරීම සඳහා වගකීම දරන අතර ආයතනය පුරා අනුකූලතා අවදානම් කළමනාකරණය පිළිබඳ ස්වාධීන අධීක්ෂණය මහ බැංකුවේ අනුකූලතා ඒකකය විසින් සිදු කරනු ලැබේ. වාර්තා කරන ලද අනුකූලතා ගැටලු සමාලෝචනය කිරීම සහ ඇගයීම් කිරීම, ඒවායේ තීව්‍රතාව තක්සේරු කිරීම හා අවධානයට ලක්විය යුතු වැදගත් කරුණු අදාළ පාලන කමිටු වෙත යොමු කිරීමට පහසුකම් සැලසීම මෙන්ම නිර්දේශිත නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම ද මීට ඇතුළත් වේ.

මීට අමතර ව මහ බැංකුව සිය ජාත්‍යන්තර සංචිත කළමනාකරණ කටයුතුවල දී මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම වැළැක්වීම පිළිබඳ දැඩි අවශ්‍යතා බලාත්මක කරනු ලබයි. මෙහි දී අදාළ නීතිමය සහ නියාමන රාමුවලට අනුකූල ව සියලුම විදේශීය පාර්ශවකරුවන් සඳහා ඔබේ පාරිභෝගිකයා හඳුනා ගැනීම සහ ගනුදෙනුකරු පිළිබඳ නිසි උද්යෝගය (KYC and CDD) පිළිබඳ පියවර අනුගමනය කරනු ලැබේ.

## තොරතුරු සහ සයිබර් ආරක්ෂණ අවදානම

ශ්‍රී ලංකා මහ බැංකුවෙහි ආයතනික අවදානම් කළමනාකරණ රාමුව යටතේ දෙවන පේළියේ ප්‍රධාන කාර්යභාරයක් ඉටු කිරීම සඳහා තොරතුරු සහ සයිබර් ආරක්ෂණ ඒකකය 2025 වසරේ දී පිහිටුවන ලදි. පාලනය, ප්‍රතිපත්තිමය මඟපෙන්වීම්, තොරතුරු ආරක්ෂක අනුකූලතා අධීක්ෂණය මෙන්ම තොරතුරු සහ සයිබර් ආරක්ෂණ අවදානම් කළමනාකරණ ක්‍රියාවලීන් නිරීක්ෂණය කිරීම හරහා ශ්‍රී ලංකා මහ බැංකුව තුළ සයිබර් ප්‍රතිරෝධීතාව ශක්තිමත් කිරීම මෙම ඒකකයේ වගකීම වේ.

පළමු පෙළේ කාර්යභාරයන්ගෙන් ස්වාධීන ව ක්‍රියාත්මක වන තොරතුරු සහ සයිබර් ආරක්ෂණ ඒකකය සියලුම දෙපාර්තමේන්තු හරහා සිදු වන තොරතුරු සහ සයිබර් ආරක්ෂණ අවදානම් හඳුනා ගැනීම, ඇගයීම සහ අවම කිරීමේ ක්‍රියාවලි අධීක්ෂණය කරයි. පළමු පෙළේ සියලු දෙපාර්තමේන්තු සිය අවදානම් හිමිකරුවන් ලෙස තමන්ගේ කාර්යභාරයන්ගෙන් උද්භව වන තොරතුරු සහ සයිබර් අවදානම් හඳුනා ගෙන ස්ථාපිත වාර්තාකරණ නාලිකා මඟින් ඒවා ඉක්මනින් වාර්තා කිරීමේ වගකීම දරන අතර තොරතුරු සහ සයිබර් ආරක්ෂණ ඒකකය විසින් එම අවදානම් ඇගයීමේ අනුකූලතාව සහතික කිරීම, ජාත්‍යන්තර තොරතුරු ආරක්ෂණ ප්‍රමිතීන්ට අනුකූල වීම ප්‍රවර්ධනය කිරීම සහ ශක්තිමත් සයිබර් අවදානම් තත්ත්වයක් පවත්වා ගැනීම සඳහා අවශ්‍ය නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග අධීක්ෂණය කිරීම සිදු කරයි. මෙහි ප්‍රගතිය නිරන්තරයෙන් මූල්‍ය නොවන අවදානම් කළමනාකරණ කමිටුව, මණ්ඩල අවදානම් අධීක්ෂණ කමිටුව, සහ පාලක මණ්ඩලය වෙත වාර්තා කරනු ලැබේ.

# අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව මහ බැංකුවේ වටිනාකම් නිර්මාණය කිරීම, ආරක්ෂා කිරීම සහ පවත්වා ගැනීම සඳහා ස්වාධීන, අවදානම් මත පදනම් වූ සහ වාස්තවික තහවුරුවක්, උපදෙස්, දැක්මක් සපයන අතර පාලනය, අවදානම් කළමනාකරණය සහ පාලන ක්‍රියාවලීන්හි ඵලදායීතාව ඇගයීමට සහ වැඩිදියුණු කිරීමට විනයවත් සහ පද්ධතිමය ප්‍රවේශයක් ගෙන ඒමෙන් බැංකුවට එහි අරමුණු සාක්ෂාත් කර ගැනීමට සහාය වේ. අවදානම් කළමනාකරණ රාමුවේ තෙවැනි පෙළ ලෙස කටයුතු කරමින් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව, මහ බැංකුවේ මෙහෙයුම් සඳහා වටිනාකම් එකතු කිරීමට සහ මෙහෙයුම් වැඩිදියුණු කිරීමට අවශ්‍ය අනාගතය කේන්ද්‍ර කර ගත් නිර්දේශ සපයයි. ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයා (CIA), අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවෙහි ප්‍රධානියා ලෙස මහ බැංකුවේ අභ්‍යන්තර විගණන කාර්යයේ ස්වාධීනත්වය සහතික කිරීම සඳහා කාර්යමය වශයෙන් විගණන කමිටුවටත්, පරිපාලනමය වශයෙන් අධිපතිවරයාටත් වාර්තා කරයි. අභ්‍යන්තර විගණන කාර්යයේ වැදගත්කම ශ්‍රී ලංකා මහ බැංකු පනතෙහි 102 වගන්තියෙන් මනාව පිළිගෙන ඇති අතර එහි අභ්‍යන්තර විගණන කාර්යයේ පාලනය, ස්වාධීනත්වය සහ වාස්තවික බව ආරක්ෂා කිරීම සඳහා ප්‍රධාන අභ්‍යන්තර විගණක වෙත තොරතුරු සඳහා ඇති නිර්බාධී ප්‍රවේශය සහතික කරන අතර ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයාගේ පත් කිරීම සහ ඉවත් කිරීම ද නිර්වචනය කර ඇත.

ශ්‍රී ලංකා මහ බැංකු පනතෙහි 102 (5) වගන්තිය ප්‍රකාර ව අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ ස්වාධීනත්වය, ආයතන ව්‍යුහය තුළ ස්ථානගත වීම සහ වාර්තාකරණයේ වගකීම් ඇතුළු විෂය පථය, අධිකාරි බලය සහ කොන්දේසි, ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයාගේ කාර්යය සහ වගකීම් සහිත ව, පාලක මණ්ඩලය විසින් අනුමත කරන ලද මහ බැංකුවේ විගණන ප්‍රඥප්තියේ නිර්වචනය කර ඇත.

තව ද 2025 වසර තුළ දී අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් අභ්‍යන්තර විගණකවරුන්ගේ ආයතනයේ (Institute of Internal Auditors), නව ගෝලීය අභ්‍යන්තර විගණන ප්‍රමිතීන් (GIAS) ප්‍රතිග්‍රහණය කරන ලද අතර මෙමඟින් 2009 සිට ප්‍රතිග්‍රහණය කරන ලද අභ්‍යන්තර විගණකවරුන්ගේ ආයතනයේ ප්‍රමිතීන්ට අනුකූල වීම සඳහා වූ දිගුකාලීන කැපවීම ශක්තිමත් කරන ලදි.

## විගණනයන් සිදු කිරීම

2025 වසර තුළ දී අවදානම් පදනම් කර ගත් වාර්ෂික විගණන සැලැස්ම බැංකුවේ වැදගත් කාර්යයන් ආවරණය වන පරිදි ක්‍රියාත්මක කළ අතර ප්‍රතිපත්තීන්, අනුකූලතාව, මෙහෙයුම්, තොරතුරු සහ සයිබර් ආරක්ෂණය, නෛතික සහ අනෙකුත් අදාළ අවදානම් ආවරණය කරමින්, බැංකුවේ උපායමාර්ගික අරමුණු ළඟා කර ගැනීම සඳහා එහි මෙහෙයුම් වැඩිදියුණු කිරීමට අවශ්‍ය නිර්දේශ ලබා දෙන ලදි. තව ද බැංකුවේ අභ්‍යන්තර විගණන කාර්යය සහ අවදානම් කළමනාකරණ කාර්යය අතර අවදානම් සම්බන්ධ තොරතුරු හුවමාරුව වසර තුළ අඛණ්ඩ ව සිදු කරන ලදි.

## විගණන ප්‍රගතිය සහ විගණන නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය පිළිබඳ පසු විපරම් වාර්තා කිරීම

වසර තුළ දී සිදු කරන ලද විගණනයන්හි ප්‍රගතිය සහ විගණන නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය විගණන කමිටුවට වාර්තා කරන ලදි. තව ද, විගණන කමිටුවේ තීරණ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය සහ කළමනාකරණ ලිපියේ ඉස්මතු කර දක්වා ඇති බාහිර විගණකගේ නිරීක්ෂණ මත ගනු ලැබූ ක්‍රියාමාර්ග ද කාලීන ව විගණන කමිටුව වෙත වාර්තා කරන ලදි.

## අවදානම් පාදක වාර්ෂික විගණන සැලැස්ම සකස් කිරීම

අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් අවදානම් පාදක වාර්ෂික විගණන සැලැස්ම සැකසීමේ දී, ආයතනික උපායමාර්ග සහ අරමුණුවලට අනුකූල වීම ශක්තිමත් කිරීම සඳහා 2024 වසර තුළ දී ප්‍රතිග්‍රහණය කරන ලද වටිනාකම් දාම ප්‍රවේශය අඛණ්ඩ ව අනුගමනය කරන ලදි. මේ සම්බන්ධයෙන් විගණනය කළ හැකි ක්‍රියාකාරකම් හඳුනා ගැනීම පිළිබඳ දැනුම්වත්භාවය වැඩිදියුණු කිරීම සහ එවැනි ක්‍රියාකාරකම් අදාළ ක්‍රියාවලි හිමිකරුවන් සමඟ සෘජුව ම තහවුරු කරගැනීම සඳහා විගණන සංගහනය (Audit Universe) යාවත්කාලීන කිරීමේ දී අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් බැංකුවේ දෙපාර්තමේන්තු එකිනෙක සමඟ රැස්වීම් පැවැත්වීය. ඒ අනුව යාවත්කාලීන කරන ලද විගණන සංගහනය භාවිතා කර විස්තීර්ණ අවදානම් තක්සේරු ක්‍රමවේදයකට අනුව 2026 වසර සඳහා අවදානම් පාදක වාර්ෂික විගණන සැලැස්ම සකස් කරන ලදි.

## පාර්ශ්වකරුවන් අතර සහයෝගීතාව

වෘත්තීය විශිෂ්ටත්වය සහ අභ්‍යන්තර විගණකවරුන්ගේ ආයතනයේ නව ගෝලීය අභ්‍යන්තර විගණන ප්‍රමිතීන් සමඟ ශක්තිමත් අනුකූලතාව පෙන්නුම් කරමින් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව අවදානම් පාදක අභ්‍යන්තර විගණනය පිළිබඳව බැංකු විදුපියෙස විසින් නේපාල රාෂ්ට්‍ර බැංකුවේ (Nepal Rastra Bank) නිලධාරීන් සඳහා 2025 මැයි මාසයේ දී සංවිධානය කරන ලද විශේෂ පුහුණු වැඩසටහනකට සම්පත් දායකත්වය සපයන ලදි.

තව ද අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව මඟින් සපයනු ලබන අභ්‍යන්තර විගණන සේවාවෙහි ගුණාත්මකභාවය තක්සේරු කිරීම සඳහා අභ්‍යන්තර විගණනය පිළිබඳ වාර්ෂික සේවාදායක ප්‍රතිපෝෂණ සමීක්ෂණය පවත්වන ලද අතර එහි ප්‍රතිඵල විගණන කමිටුවට දැනුම් දෙන ලදි.

## තත්ත්ව තහවුරු කිරීමේ සහ වැඩිදියුණු කිරීමේ වැඩසටහන (QAIP)

අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ ස්ථාපිත කර ඇති තත්ත්ව තහවුරු කිරීමේ සහ වැඩිදියුණු කිරීමේ වැඩසටහන තුළ ගෝලීය අභ්‍යන්තර විගණන ප්‍රමිතීන් සමඟ අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවෙහි අනුකූලතාව පිළිබඳ බාහිර සහ අභ්‍යන්තර තක්සේරු කිරීම් මෙන් ම, සිය අරමුණු සාක්ෂාත් කර ගැනීමෙහි සහ අඛණ්ඩ සංවර්ධනය ප්‍රවර්ධනය කිරීමෙහි ලා අභ්‍යන්තර විගණන කාර්යයේ ප්‍රගතියෙහි කාර්ය සාධනයන් ද අන්තර්ගත වේ.

අභ්‍යන්තර විගණන කාර්යය තුළ තත්ත්ව ප්‍රවර්ධනය, සහ තත්ත්ව තහවුරු කිරීමේ සහ වැඩිදියුණු කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ දී, අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් අභ්‍යන්තර තක්සේරු කිරීම් සිදු කරන ලද අතර එහි 2025 වර්ෂයට අදාළ කාලානුරූප ස්වයං තක්සේරු වාර්තාව සහ අභ්‍යන්තර විගණන කාර්යයේ කාර්ය සාධනයෙහි අඛණ්ඩ අධීක්ෂණය අන්තර්ගත විය.